# අධ්‍යාපන අමාත්‍යාංශය

## දිවයින පුරා පිහිටි ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු පිරවීම - 2020

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි පුරප්පාඩු වී ඇති ජාතික පාසල් 170ක විදුහල්පති තනතුරු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු වී ඇති අයදුම්පත් කැඳවනු ලබන ජාතික පාසල් සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් පත් කිරීමට අදාළ සේවය, ශ්‍රේණිය ඇතුළත් පුරප්පාඩු වී ඇති ජාතික පාසල් ලේඛනය, අයදුම් කිරීමට අදාළ සුදුසුකම්, ක්‍රමවේදය සමඟ අනෙකුත් සියලුම තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍රය 2020.11.06 දින www.moe.gov.lk දරන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකර ඇත.

අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියේ පළ කරන ලද ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර පහත දැක්වෙන ලිපිනයට 2020.12.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත් ලියාපදිංචි තැපෑලට යොමු කරන අතර, පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයටද යොමු කළ යුතුය.

**විද්‍යුත් තැපැල් ලිපිනය -** eseas.moe@gmail.com
sasese.moe@gmail.com

ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ජාතික පාසල් විදුහල්පති තනතුර"** යන්න සඳහන් කොට අයදුම්පත් **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට යොමු කළ යුතුය.

**මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා**

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය, බත්තරමුල්ල.**

2020.11.16